ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - අඹගමුව කෝරළය- ගිනිගත්හේන
பிரதேச செயலகம்-அம்பகமுவ கோரளை- கினிகத்தேனை
**Divisional Secretariat –Ambagamuwa Koralaya-Ginigathhena**
web : www.ambagamuwa.ds.gov.lk e-mail : info@ambagamuwa.ds.gov.lk

මගේ අංකය
எனது இல අඹකෝ/2/5/39
My no

ඔබේ අංකය
உமது இல
Your no

දිනය
திகதி 2025.11.24
Date

RECEIVED

කළමනාකරු,
EWIS Peripherals (Pvt) Ltd,
Yathama Building,
No.14, Galle Road,
Colombo 03.

<u>කාර්යාලයේ අවශ්‍යතා සඳහා අවශ්‍ය ටෝනර් මිලදී ගැනීම 2025 - සෘජු මිලදී ගැනීම් ක්‍රමය</u>

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අංක රහිත 2025.09.11 දිනැති ලිපියට අදාලව (ඇමුණුම 01) ඔබ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් මත මෙහි පහත සඳහන් අයිතම මිලදී ගැනීමට අඹගමුව කෝරළය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී.

02. ඒ අනුව මෙහි සඳහන් ඇණවුම මෙම ලිපිය ලැබී දින 07 ක් ඇතුලත මෙම කාර්යාලය වෙත කඩිනමින් ගෙනවිත් භාරදෙන ලෙසත්, එසේ නොවුනහොත් ඇණවුම අවලංගු වන බව දැනුම් දෙමි.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | ඒකකයක මිල වැට් රහිත (රු.) | මුළු මුදල වැට් රහිත (රු.) |
|---|---|---|---|---|
| 01 | Pantum p3305 dw toner | 01 | 19,000.00 | 19,000.00 |
| | එකතුව | | | 19,000.00 |

03 තවද, ඉහතභාණ්ඩවලට අදාල බිල්පත සමඟ පොදු 35 වවුචර් පිටපත් සහිතව යොමු කරන මෙන්ද,භාණ්ඩ ගෙනැවිත් භාර දීමෙන් පසුව චෙක්පත් මඟින් ගෙවීම් සිදු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කේ.එල්.එන්.ඩී.ලියනගේ,
ගණකාධිකාරී,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
අඹගමුව කෝරළය

කාර්යාලය
அலுவலகம்
Office +94 51 2242213
ෆැක්ස්
பெக்ஸ்
Fax +94 51 2242760
ප්‍රාදේශීය ලේකම්
பிரதேச செயலாளர்
Divisional Secretary +94 51 224228

සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය
சமூகப் பாதுகாப்புக் கருத்திட்டம்
**SOCIAL PROTECTION PROJECT**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය | நலன்புரி நன்மைகள் சபை | **WELFARE BENEFITS BOARD**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
**MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT**

ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே.ஆர். ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07.

| මගේ අංකය / எனது இல / My No. | ඔබගේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2025.09. 11 |
|---|---|---|

ප්‍රාදේශීය ලේකම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

Ambagamuwa.........

<u>ඔබ කාර්යාලයේ ස්ථාපිත කර ඇති සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකය සඳහා මුද්‍රණ යන්ත්‍රයක් ලබා දීම</u>

සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයන්හි කාර්යක්ෂමතාවය ඉහල නැංවීම උදෙසා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙනුවෙන් සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය විසින් මිලටගත් මුද්‍රණ යන්ත්‍රයක් මෙම ලිපිය රැගෙන එන EWIS Peripherals(Pvt) Ltd ආයතනය විසින් ඔබ වෙත ලබා දේ. එම මුද්‍රණ යන්ත්‍රය ඔබ ආයතනය විසින් භාරගෙන පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**1. මුද්‍රණ යන්ත්‍රයේ අයිතිය පැවරීම**

ඉහත සඳහන් මුද්‍රණ යන්ත්‍රයේ අයිතිය ඔබ කාර්යාලය වෙත පැවරීමට අදාළ නිකුත් කිරීමේ නියෝගය (පොදු 141) මෙම ලිපියට අමුණා ඇති අතර ඒ අනුව පහත කටයුතු ඉටු කරන ලෙස ඉල්ලා සිටිමි.

I. මුද්‍රණ යන්ත්‍රය පරීක්ෂා කර භාර ගැනීම.
II. මුද්‍රණ යන්ත්‍රය ලැබුනු බව තහවුරු කිරීමට මෙම ලිපියට අමුණා ඇති "Good Received Note" පුරවා වගකිව යුතු නිලධාරියකුගේ අත්සන සහ රබර් මුද්‍රාව යොදා මෙම ලිපිය රැගෙන EWIS Peripherals (Pvt) Ltd ආයතනයේ නියෝජිතයා හට භාර දීම.
III. මුද්‍රණ යන්ත්‍රය ඔබගේ ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කිරීමට කටයුතු කරන බවට සාක්ෂි ලෙස නිකුත් කිරීමේ නියෝගය (පොදු 219) මෙම ලිපිය සමග මුද්‍රණ යන්ත්‍රය රැගෙන එන EWIS Peripherals (Pvt) Ltd ආයතනයේ නියෝජිතයාට භාර දීම. ඔබ වෙත ලබා දෙන මුද්‍රණ යන්ත්‍රයේ අනු අංකය **(Serial Number )** පොදු **219** ඇතුලත් කිරීම අනිවාර්ය බව සිහිපත් කරමි.

**2. මුද්‍රණ යන්ත්‍රයේ නිෂ්පාදන දෝෂ නිවැරදි කිරීම**

මෙම මුද්‍රණ යන්ත්‍රය සඳහා වසර තුනක(3) ක එනම් 2028.09.08 තෙක් නිෂ්පාදිත දෝෂ නිරවුල් කිරීමට EWIS Peripherals (Pvt) Ltd ආයතනය බැඳී සිටින බැවින් 2028.09.08 තෙක් ඔබ වෙත භාර දෙන මුද්‍රණ යන්ත්‍රයේ නිෂ්පාදන දෝෂයක් හේතුවෙන් හානියක් වුවහොත් දුරකථන අංක 011-7496000 මගින් EWIS Peripherals (Pvt) Ltd ආයතනය දැනුවත් කර මුද්‍රණ යන්ත්‍රයේ සිදුව ඇති තාක්ෂණික දෝෂය නිරාකරණය කරගැනීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

එසේ දැනුවත් කිරීමෙන් පසු බස්නාහිර පළාත තුල පිහිටි කාර්යාලයකට නම් සතියේ වැඩ කරන දිනයන්හි පැය 24ක් ඇතුළත හා අනෙකුත් පළාත් වල පිහිටි කාර්යාල වලට නම් සතියේ වැඩ කරන දිනයන්හි පැය 48 ක් ඇතුළත අදාල දෝෂය නිරවුල් කිරීමට තාක්ෂණික නිලධාරියෙකු එවීමට EWIS Peripherals (Pvt) Ltd ආයතනය බැඳී සිටී.

ඉහත පරිදි EWIS Peripherals (Pvt) Ltd ආයතනය වෙතින් නිසි ප්‍රතිචාර ලැබීමක් නොවුවොත් මේ සම්බන්ධයෙන් දුරකථන අංක 011 219 6614 මගින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටිමි.

මෙම මුද්‍රණ යන්ත්‍රයට නිෂ්පාදන දෝෂයක් නොවන වැටීම්, තැලීම්, සිරීම් හා අපරික්ෂාකාරී පරිහරණය කිරීමෙන් සිදුවන අලාභ හානි සම්බන්ධයෙන් **EWIS Peripherals (Pvt) Ltd** ආයතනය වගකීමට බැඳී නොමැති බවද දන්වා සිටිමි. නිෂ්පාදන දෝෂයන්ගෙන් පරිබාහිර වූ ඉහත සඳහන් දෝෂයන් නිරවුල් කිරීමට **EWIS Peripherals (Pvt) Ltd** ආයතනය විසින් ගාස්තු අය කිරීමකට යටත්ව එය සිදු කරනු ඇත.

3. මුද්‍රණ යන්ත්‍රයට අවශ්‍ය ටෝනර් කාට්රිජ සහ Drum Unit මිලට ගැනීම

තවද,මෙම මුද්‍රණ යන්ත්‍රය සඳහා 2028.09.08 දින තෙක් වර්ෂ තුනක කාලය තුල සියලුම නඩත්තු කටයුතු EWIS Peripherals (Pvt) Ltd ආයතනය විසින් කරනු ලබන අතර මුද්‍රණ යන්ත්‍රය භාවිතයේදී අවශ්‍ය වන ටෝනර් සහ Drum Unit එම ආයතනයෙන්ම පහත සඳහන් මිල ගණන් යටතේ 2028.09.08 තෙක් මිලදී ගැනීමේ පදනම මත මෙම මුද්‍රණ යන්ත්‍රය මිලට ගෙන ඇත.

ටෝනර් කාට්රිජයක මිළ - රු. 19,000.00 (වැට් රහිත මිල)

Drum Unit එකක මිළ - රු. 22,000.00 (වැට් රහිත මිල)

2025.04.07 දිනට ඇමරිකානු ඩොලරයක් සඳහා රු. 301.0425 ක් වන විනිමය හුවමාරු අනුපාතය පදනම් කරගෙන ඉහත ටෝනර් සහ Drum Unit එකක මිල ගණන් තීරණය කර ඇත. ඇමරිකානු ඩොලරයේ විනිමය අනුපාතය ± 10% කින් වෙනස් වුවහොත් ඒ අනුව ටෝනර් හා Drum Unit එකක මිල සමානුපාතිකව වෙනස් වේ. එබැවින්, EWIS Peripherals(Pvt) Ltd ආයතනය විසින් ඉහත මිල ගණන් වලට වෙනස් මිලකට ටෝනර් හා Drum Unit සැපයීමට කටයුතු කලහොත් එය මිලදී ගැනීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ විමසා අවශ්‍ය උපදෙස් ලබා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

කොළඹ දිස්ත්‍රික්කයේ කාර්යාල සඳහා සතියේ වැඩ කරන දින දෙකක් තුලත් අනෙකුත් දිස්ත්‍රික්ක වල පිහිටා ඇති කාර්යාල සඳහා සතියේ වැඩ කරන දින තුනක් තුලදී ටෝනර් සහ Drum Unit සැපයීමට EWIS Peripherals(Pvt) Ltd ආයතනය බැඳී සිටි.එම ටෝනර් හා Drum Unit ඔබ කාර්යාලයට ලැබීමට ගතවන කාලය සැලකිල්ලට ගෙන ටෝනර් හා Drum Unit ඇනවුම් කිරීමෙන් ඔබගේ මුද්‍රණ අවශ්‍යතා බාධාවකින් තොරව ඉටු කර ගත හැක.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කටයුතු වෙනුවෙන් ඔබ දැක්වූ සහයෝගයට ස්තූතියි.

077-3951135, Manjula

එස්. යූ මන්ද්‍රකුමරන්
ව්‍යාපෘති අධ්‍යක්ෂක(වැඩ ආවරණ)

ඇමුණුම : 1. නිකුත් කිරීමේ නියෝගය (පොදු 141)
2. Good Received Note ආකෘති පත්‍රය